## ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය -2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ විගණන මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

විගණනයේදී පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාලත්වය හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (IRQUE) නිමකිරීමෙන් පසු එම ව්‍යාපෘතියේ වත්කම් විශ්ව විද්‍යාලයට භාරදී තිබුණද, එම වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂය තුළදී මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.9,555,427 ක් වටිනා රසායනාගාර උපකරණ ගිණුම්ගත කර නොතිබුණි.

### 1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වු අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) මුදල් රෙගුලාසි** | |
| (i). මු.රෙ. 102 | 1990 වර්ෂය තුළදී සිදුවී තිබු රු.17,860,815 ක් වු පාඩු සම්බන්ධයෙන් අදාළ පියවර ගෙන |

| | | |
|---|---|---|
| | | නොතිබුණි. |
| (ii). | මු.රෙ.371 | වර්ෂ 1 සිට 17 දක්වා කාලයක් පැවති විවිධ කාර්යයන් සඳහා ගෙවන ලද එකතුව රු.මිලියන 14.61 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii). | මු.රෙ.756 | සමාලෝචිත වර්ෂය අවසානයේදී විශ්ව විද්‍යාලයේ වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් සිදුකර නෙතිබුණි. |
| (iv). | මු.රෙ.1646 | විශ්වි විද්‍යාලයේ වාහන වලට අදාල දෛනික ධාවන සටහන් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය

| | | |
|---|---|---|
| (i). | X පරිච්ඡේදයේ 20.6 වගන්තිය | නිලධාරීන් විසින් ලබාගන්නා ලද වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර මාසිකව පොදු ආකෘති 96 මඟින් විගණකාධිපතිට වාර්තා කර නොතිබුණි. |
| (ii). | XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම පැමිණීමේ ලේඛනයේ සටහන් කර නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ විශ්ව විද්‍යාලයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රු.516,211,000 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසුව රු.84,147,590 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු.437,448,075 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසුව රු.59,498,212 ක ඌනතාවයක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.24,649,378 ක තවදුරටත් පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ප්‍රධාන වශයෙන් මෙහෙයුම් වියදම් රු.96,267,379 කින් වැඩිවීම එම පිරිහීමට හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

#### (අ) පවත්වන ලද විභාග වල ප්‍රතිඵල

ලබාගත හැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද විභාග වලදී උපාධිලාභීන්ගේ කාර්ය සාධනය පහත දැක්වේ.

| පීඨය | විභාග පවත්වන ලද කාලය | විභාග වලට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව (පළමු වසර සිට අවසන් වසර දක්වා ) | සමත් වු සිසුන් සංඛ්‍යාව ( අවසන් වසර ) |
|---|---|---|---|
| කෘෂිකර්මය | 2012 මාර්තු , අප්‍රේල් , ඔක්තෝබර් , නොවැම්බර් සහ දෙසැම්බර් | 175 | 27 |
| කලා | 2012 මාර්තු , අප්‍රේල් , ජුනි, ජුලි , ඔක්තෝබර් සහ නොවැම්බර් | 1,220 | 333 |
| වාණිජ හා කළමනාකරණය | 2012 පෙබරවාරි , මාර්තු , අප්‍රේල් , මැයි , ජුනි, ජුලි , සැප්තැම්බර් , නොවැම්බර් සහ දෙසැම්බර් | 716 | 91 |
| විද්‍යා | 2012 පෙබරවාරි , මාර්තු , අප්‍රේල් , ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් | 422 | 48 |
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාව | 2012 පෙබරවාරි , මාර්තු , අප්‍රේල් , ඔක්තෝබර් , නොවැම්බර් සහ දෙසැම්බර් | 238 | 27 |
| එකතුව | | 2,771 | 526 |

**(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය**

විශ්ව විද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.482,847,281 ක් විය. වර්ෂයේ ඒක ශිෂ්‍ය සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු.174,376 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ඒක ශිෂ්‍ය පිරිවැය රු.43,705 කින් වැඩිවී තිබුණි.

**(ඇ) මහපොළ හා ශිෂ්‍යාධාර**

සමාලෝචිත වර්ෂය තුළදී ශිෂ්‍යයින් 5,503 දෙනෙකුට මහපොළ ආධාර ලෙස රු.11,833,100 ක් හා ශිෂ්‍යයින් 8,301 දෙනෙකුට ශිෂ්‍යාධාර ලෙස රු.16,598,400 ක් ගෙවා තිබුණි.

**(ඈ) පුස්තකාල පරිපාලනය**

පුස්තකාලයෙන් පොත් ලබාගත් අධ්‍යයන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් විසින් නිශ්චිත කාල පරිච්ඡේදය තුළදී පොත් 409 ක් ආපසු භාරදී නොතිබුණි. මෙම පොත් ආපසු ලබාගැනීම සඳහා මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශිෂ්‍යත්ව මත විදේශගත වූ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන් 57 ක් ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසුව විශ්ව විද්‍යාලයේ රාජකාරි සඳහා වාර්තා නොකර හෝ විශ්ව විද්‍යාලයෙන් ඉවත්ව ගොස් තිබුණි. කෙසේ වුවද ගිවිසුම් කඩ කිරීම් සම්බන්ධයෙන් කථිකාචාර්යවරුන් 57 ගෙන් රු.70,407,561 ක මුදලක් අයකර ගැනීමට විශව විද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු 52 ක් පිරවීමට 2012 දෙසැම්බර් 31 දක්වා විශ්ව විද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි. එබැවින් එය ශිෂ්‍යයින්ගේ අධ්‍යයන කටයුතු සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ඇ) පශ්චාත් - උපාධි ප්‍රදානය සඳහා 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 29 (ඇ) හා 29(ඉ) වගන්ති ප්‍රකාරව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය 2012

දෙසැම්බර් 31 දක්වාත් ලබාගෙන නොතිබුණි. කෙසේ වුවද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියෙන් තොරව පශ්චාත් උපාධි පාඨමාලා 22 ක් පවත්වා තිබුණි.

(ඇ) රු.මිලියන 1.18 ක් වු අත්තිකාරම් පුද්ගලයින් 54 දෙනෙකුට ගෙවා තිබුණු අතර, පුද්ගලයින් හඳුනා ගැනීමට හා අත්තිකාරම් ආපසු අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 5 සිට 17 දක්වා වු කාලයක් මෙම අත්තිකාරම් නිරවුල් නොකර පැවතුණි.

**3.3 මෙහෙයුම් සමාලෝචනය**
----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය**
--------------------------------

සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ ( FHCS ) භාවිතය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වටිනාකම රු.මිලියන 13.4 කට ඉන්දියාවේ පුද්ගලික සමාගමකින් වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදනය සඳහා ලංසුකරුවන් තිදෙනෙක් ලංසු ඉදිරිපත් කර තිබුණි. ලංසු තුනෙන් දෙකක් ව්‍යාජ ඒවා වු අතර එක් ලංසුවක් ඇහළුම් උපාංග සැපයුම්කරුවකු ගෙන් විය.

(ii) ලංසුකරුවන් දෙදෙනෙකුගේ දුරකථන අංක හා ලිපිනයන් සර්වාකාරයෙන්ම සමාන විය.

(iii) "eight accessories of the tissue processor" නැමති වෛද්‍ය උපකරණය රු.මිලියන 4.5 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර තිබුණද, ටිෂු ප්‍රොසෙසර්යේ (Tissue Processor ) ප්‍රධාන අංගය නොමැතිවීම හේතුවෙන් මිලදීගත් දින සිට එය නිෂ්කාර්යව පැවතුණි .

(iv) මෙම උපකරණය සඳහා දේශීය සැපයුම්කරුවන් පිළිබඳ සැලකිමෙන් තොරව මිල කැඳවීම් තුනම ඉන්දියාවෙන් ලබාගෙන තිබුණි.

(v) ලබාගත හැකිවු තොරතුරු අනුව ජාත්‍යන්තර වෙළඳපොලෙහි පවතින මිලට වඩා ඉහළ මිලක් මෙම උපකරණ සඳහා ගෙවා තිබුණි. උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

| විෂයයේ නම | වෙළඳපල මිල (එජඩො) | ගැණුම් මිල (එජඩො) |
|---|---|---|

| | | |
|---|---|---|
| මෘත ශරීරාගාර ශීතකරණ (Mortuary Chambers ) | 1320 සිට 7900 (පරාසය ) | 26,000 |
| අල්ට්‍රා සවුන්ඩ් ස්කැනර් (Ultra Sound Scanner ) | 8,000 සිට 15,000 | 36,324 |
| බයිනොකියුලර් මයික්‍රස්කෝප් ( Binocular Microscope ) | 2,123 සිට 4,425 | 9,015 |

(ආ) පුස්තකාල ස්වයංකරණ කළමනාකරණ මෘදුකාංගය ( Library Automation Management Software ( "Libsys" ) එ ජ ඩො 27,400 (රු.මිලියන 3.2 ) කට ප්‍රසම්පාදනය කිරීම

2008 වර්ෂයේදී රු.මිලියන 3.2 ක පිරිවැයකට ඉන්දියාවේ හර්යානා හි එම්/එස් ලිබ්සීස් ටෙක්නොලොජ්ස් පිවීටී ලිමිටඩ් ආයතනයෙන් "ලිබ්සීස් " මෘදුකාංග පද්ධතිය ප්‍රසම්පාදනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ගෙවීම සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) තාක්ෂණ ඇගයීම් කමිටුව (TEC) විසින් ප්‍රසම්පාදනය නිර්දේශ කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන කමිටුවේ (PC ) අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) විශ්ව විද්‍යාලය සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි.

(iv) විශ්ව විද්‍යාලය සැපයුම්කරුගෙන් කාර්ය සාධන බැදුම්කරයක් ලබාගෙන නොතිබුණි.

(v) කොන්ත්‍රාත් ලිපිය ප්‍රකාරව , සැපයුම්කරු විසින් " Linux System " සැපයිය යුතු විය. කෙසේ වුවද සැපයුම්කරු විසින් 2009 අප්‍රේල් 27 දින "Windows System" සපයා සවිකර තිබුණි.

(vi) දත්ත අපනයන හා ආනයන මොඩියුලය , වාර්තා උත්පාදනය කෙරෙන මොඩියුලය හා දත්ත බැක්අප් මොඩියුලය වැනි පද්ධති සංරචක නොමැතිවීම හේතුවෙන් "Libsy's" පද්ධතිය එහි සම්පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවූ බව භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය.

(vii) සැපයුම්කරුට ලැබිය යුතු එජඩො 10,960 ( මුළු පිරිවැයෙන් 40% ) ක් නොගෙවීම හේතුවෙන් සවිකිරීමෙන් පසු වර්ෂ 3 ක සහාය සෙවාව සැපයුම්කරු විසින් සිදුකර නොතිබුණි.

(viii) මෙම පද්ධතිය රු.මිලියන 3.2 ක පිරිවැයකට 2008 වර්ෂයේදී ප්‍රසම්පාදනය කර තිබුණද, පද්ධතිය පුස්තකාලයේ සවිකර තිබුණේ 2009 අප්‍රේල් 27 දින දීය.

(ඇ) සෞඛ්‍ය ආරක්ෂණ පීඨයේ , හෙද උපාධි වැඩ සටහනට පහසුකම් සැපයීම සඳහා නොර්වේහි "ට්‍රොම්සෝ " විශ්ව විද්‍යාලයෙන් රු.17,372,951 ක අරමුදල් ලැබී තිබුණද , මේ සම්බන්ධයෙන් විධිමත් වාර්තා පවත්වා නොතිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා විශ්ව විද්‍යාල පාලක සභාවෙන් හා සනාථන සභාවෙන් අනුමැතින් ලබාගෙන නොතිබු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

### 4.1 අයවැය පාලනය

ඇයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර විශාල විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

### 4.3 විගණන කමිටුව

සමාලෝචිත වර්ෂය තුළදී විගණන කමිටු රැස්වීම් 9 ක් පවත්වා තිබුණි. රැස්වීම් කිහිපයකදී විගණන විමසුම් වලට පිළිතුරු සපයන ලෙස කමිටුව නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන විමසුම් 6 කට පිළිතුරු සැපයීමට කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ගෙවීම් හා අත්තිකාරම් නිරවුල් කිරීම

(ඇ) ප්‍රසම්පාදන